# 2005 න් පසු අවධියේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය: ගැටලු සහ ප්‍රවනතා

**නිශාන්ත හෙට්ටිආරච්චි**
**දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***nishantha.hettiarachchi1@gmail.com***

අන්තර්ජාතික සාමාජය තුළ සෑම රාජ්‍යයක් ම වෙනත් රාජ්‍යයන් සමග කුමන හෝ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම අන්තර්ජාතික දේශපාලනයේ විශේෂ ලක්ෂණය වේ. වර්තමානයේ දී අන්තර්ජාතික කටයුතුවලට මැදිහත් නොවී සිටීමේ හැකියාවක් කිසිදු රාජ්‍යයකට නොමැත. මෙලෙස රාජ්‍යයන් විසින් අන්තර්ජාතික කටයුතුවලට මැදිහත් වීම විධිමත් සහ නිශ්චිත මූලධර්ම මාලාවක් මත පවත්වා ගෙන යා යුතු ය. අන්තර්ජාතික දේශපාලනයේ දී මෙය විදේශ ප්‍රතිපත්තිය ලෙස හඳුන්වයි. මේ අනුව රටකට නිශ්චිත විදේශ ප්‍රතිපත්තියක් තිබිය යුතුය. විදේශ ප්‍රතිපත්තිය සැකසීම නූතන රාජ්‍යයන් සතු අතිශය වැදගත් කාර්යයකි. නිදහසින් පසු අවධියේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ජා කිරීමේ දී එය ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් විය. මෙහිදී සැලකිල්ලට ගනු ලබන්නේ 2005 දී බලයට පත් මහින්ද රාජපක්ෂ රජයේ විදේශ ප්‍රතිපත්තියයි. මෙම අවධියේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේ වැදගත් සාධකය වූයේ ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවති ගැටුම විය. එම ගැටුම විසදීම පිණිස අනුගමනය කළ ක්‍රියාකලාපය මත ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික සම්බන්ධතා තීරණය විය. මෙම යුගයේ දී ජනවාර්ගික ගැටුම විසදීමේ ප්‍රවේශයේ වෙනසක් විය. ඒ අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානය මිලිටරි වශයෙන් පරාජය කිරීමත්, ඒකීය රාජ්‍ය ව්‍යුහය ආරක්ෂා කෙරෙන දේශපාලන විසඳුමක් යෝජනා කිරීමත් සිදු විය. එහෙත් මෙම ප්‍රවේශයට බටහිර බලවතුන් සහ එක්සත් ජාතින්ගේ සංවිධානය ප්‍රමුඛ අන්තර්ජාතික ප්‍රජාව එකඟ නොවී ය. කෙසේ වෙතත් 2009 වසර මැද භාගයේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානය මිලිටරිමය වශයෙන් පරාජය විය. මේ අවස්ථාවේ දී බටහිර බලවතුන් ශ්‍රී ලංකා රජය ලැබූ යුධ ජයග්‍රහණය විවේචනය නොකළත්, ගැටුමට තුඩු දුන් මූල හේතුවලට විසඳුම් ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබී ය. එමෙන්ම පශ්චාත් යුධ සමය තුළ පිළිගත හැකි ප්‍රතිසංධාන ක්‍රියාදාමයක් සිදු විය යුතු බව පෙන්වා දුන්නේ ය. එහෙත් ශ්‍රී ලංකා රජය මේ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම නිසා බටහිර බලවතුන් විසින් ගැටුම අවසාන භාගයේ දී සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය වීම් සහ යුධ අපරාධ පිළිබඳ චෝදනා කරන ලදී. මෙයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකාව ක්‍රමයෙන් බටහිර බලවතුන්ගෙන් ඈත්වීමත්, ඒ වෙනුවට ආසියාතික සහ මැදපෙරදිග රටවල් සමග සමීප වීමත් සිදු විය. මෙම අධ්‍යයනය ද්විතික මූලාශ්‍ර මත පදනම් ව සිදු කෙරේ.

***ප්‍රමුඛ පද:*** *විදේශ ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාව, එල්.ටී.ටී.ඊ. සංවිධානය, බටහිර බලවතුන්, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන*